## තොරතුරු දැනගැනීමේ පනත යටතේ

# ප්‍රගාමීව තොරතුරු (මාර්ගගතව) හෙළිකිරීම:

## රාජ්‍ය අධිකාරීන් ශ්‍රේණිගත කිරීම

2023 සැප්තැම්බර්




## විධායක සාරාංශය

තොරතුරු දැනගැනීමේ පනත යටතේ

# ප්‍රගාමීව තොරතුරු (මාර්ගගතව) හෙළිකිරීම:

## රාජ්‍ය අධිකාරීන් ශ්‍රේණිගත කිරීම

## විධායක සාරාංශය

2023 සැප්තැම්බර්

Copyright © 2023 Verité Research Pvt Ltd.  All rights reserved.

# විධායක සාරාංශය

වෙරිටේ රිසර්ච් ආයතනය විසින් 2017 දී ලෝක බැංකුවේ සහාය ඇතිව මෙම තක්සේරුව සඳහා ක්‍රමවේදය සකස් කරන ලද අතර, ඒ යටතේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ රාජ්‍ය අධිකාරීන් 55ක්, ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම තක්සේරු කරන ලදී. 2022 ජුලි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා පත්ව සිටි කැබිනට් අමාත්‍යාංශ 29 සහ ජනාධිපති සහ අගමැති කාර්යාල සම්බන්ධයෙන් ද එම ක්‍රමවේදයම අනුගමනය කරන ලදී.

අධ්‍යයනය සඳහා වූ ක්‍රමවේදය පදනම් වූයේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 8 සහ 9 වගන්ති යටතේ සහ පනත යටතේ අංක 20 දරන රෙගුලාසි යටතේ දක්වා ඇති ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කිරීම් සඳහා වන නීතිමය අවශ්‍යතා මතය. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 8 සහ 9 වගන්ති අදාළ වන්නේ අමාත්‍යාංශවලට පමණි (එනිසාම ජනාධිපති සහ අගමැතිගේ කාර්යාලයන් එයට යටත් නොවේ). රෙගුලාසි අංක 20 අමාත්‍යාංශ සහ ජනාධිපති සහ අගමැති කාර්යාල ඇතුළු සියලු රාජ්‍ය අධිකාරීන්ට අදාළ වේ.


රාජ්‍ය අධිකාරීන් ශ්‍රේණිගත කර ඇත්තේ ඔවුන් ප්‍රගාමීව, මාර්ගගතව තොරතුරු කාණ්ඩ 11කට අදාළ තොරතුරු හෙළිදරව් කිරීම මත පදනම්ව වන අතර ඒවා තවදුරටත් උපප්‍රවර්ග 30කට බෙදා ඇත. තොරතුරු කාණ්ඩවලට ඇතුළත් වන්නේ:

1. ආයතනික තොරතුරු
2. සංවිධානාත්මක තොරතුරු
3. මෙහෙයුම් තොරතුරු සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්
4. රාජ්‍ය සේවා
5. රාජ්‍ය ප්‍රතිපත්ති, නීති සම්පාදනය සහ නියාමන
6. ජනතා සහභාගීත්වය
7. රාජ්‍ය ප්‍රසම්පාදන සහ සහනාධාර
8. අයවැය, වියදම් සහ මුදල්
9. තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා වර්ගීකරණය සහ පද්ධති
10. පෙර තොරතුරු හෙළිදරව් කිරීම්
11. තොරතුරු දැනගැනීමේ පනතේ 9 වැනි වගන්තිය යටතේ රාජ්‍ය ආයෝජන පිළිබඳ පූර්ව හෙළිදරව් කිරීම්.


රාජ්‍ය අධිකාරීන්, අන්තර්ගතයන් හෙළිදරව් කිරීම මත, භාවිතයේ පහසුව මත සහ සමස්තයක් ලෙස ලකුණු ලබාදීම සිදුකෙරුණි. ලැබුණු ලකුණු අනුව රාජ්‍ය අධිකාරීන් පහත කාණ්ඩ යටතේ වර්ග කිරීම සිදුවිය.

- 0-10%: අසතුටුදායකයි
- 11-40%: මධ්‍යස්ථව අසතුටුදායකය
- 41-60%: මධ්‍යස්ථව සතුටුදායකයි
- 61-80%: සතුටුදායකයි
- 81-100%: ඉතා සතුටුදායකයි.

**ප්‍රදර්ශිතය 1: 2017 දී සංයුක්ත සමස්ත ලකුණු**




**ප්‍රදර්ශිතය 02: 2022 දී සංයුක්ත සමස්ත ලකුණු**




ප්‍රදර්ශිතය 01 අනුව, 2017 දී, බහුතර රාජ්‍ය අධිකාරීන් 'මධ්‍යස්ථ අසතුටුදායක' කාණ්ඩයටත්, සමහර රාජ්‍ය අධිකාරීන් ද 'අසතුටුදායක' කාණ්ඩයටත්, වැටී ඇත.


2022 දී, 'මධ්‍යස්ථව සතුටුදායක' කාණ්ඩයේ රාජ්‍ය අධිකාරීන්ගේ ප්‍රතිශතය වැඩි වීමත් සමඟ යම් දියුණුවක් පවතින මුත් 'සතුටුදායක' කාණ්ඩය යටතේ කිසිඳු රාජ්‍ය අධිකාරියක් ලකුණු ලබා ගෙන නොමැති බව, ප්‍රදර්ශිතය 02 මගින් පැහැදිලි වේ.

ඉහළම සමස්ත ලකුණු හිමිකරගත් රාජ්‍ය අධිකාරීන් වූයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය (57%) සහ කෘෂිකර්ම අමාත්‍යාංශය (53%) යි.

අඩුම සමස්ත ලකුණු ලබාගත් රාජ්‍ය අධිකාරීන් වූයේ ජනාධිපති කාර්යාලය (18%), අගමැති කාර්යාලය (17%) සහ තාක්ෂණ අමාත්‍යාංශය (13%) යි.

**අන්තර්ගතයන් හෙළිදරව් කිරීම්** මත රාජ්‍ය අධිකාරීන් ලබාගෙන ඇති ලකුණු දැක්වෙන ප්‍රදර්ශිතය 03 අනුව, බහුතර රාජ්‍ය අධිකාරීන් 'මධ්‍යස්ථ අසතුටුදායක' කාණ්ඩ තුළ ලකුණු ලබා ගෙන ඇත. කිසිඳු පොදු අධිකාරියක් 'අසතුටුදායක' කාණ්ඩයට ඇතුළත්ව නොමැත.

**ප්‍රදර්ශිතය 3: අන්තර්ගතයන් හෙළිදරව් කිරීම් මත ලබාගෙන ඇති ලකුණු**




අයවැය, වියදම් සහ මූලය, ආයතනික තොරතුරු, ආයතනික තොරතුරු සහ රාජ්‍ය ප්‍රතිපත්ති, නීති සම්පාදන සහ නියාමන කාණ්ඩවල වඩාත් යාවත්කාලීන සහ සම්පූර්ණ තොරතුරු හෙළි කිරීමට රාජ්‍ය අධිකාරීන් නැඹුරු වී ඇත. කෙසේ වෙතත්, මෙම තොරතුරු ද්විතීයික වෙබ් අඩවිවලින් ද, එනම් මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් (අයවැය සඳහා) හෝ www.documents.gov.lk වෙබ් අඩවියෙන් (නීති සම්පාදනය සඳහා) ලබා ගත හැකි විය.

අන්තර්ගතයන් හෙළිදරව් කිරීම් කාණ්ඩයේ ඉහළම ලකුණු ලබාගත් රාජ්‍ය අධිකාරීන් වූයේ කෘෂිකර්ම අමාත්‍යාංශය (57%), රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය (51%) සහ පරිසර අමාත්‍යාංශය (42%) යි.

මෙම කාණ්ඩයේ අඩුම ලකුණු ලබාගත් රාජ්‍ය අධිකාරීන් වූයේ: ජනාධිපති කාර්යාලය (17%), තාක්ෂණ අමාත්‍යාංශය (15%) සහ අගමැති කාර්යාලය (13%) යි.

ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කිරීම තේමා තුනක් යටතේ ද විශ්ලේෂණය කරන ලදී:

1. මහජන වගවීම
2. මහජන ප්‍රවේශය
3. තොරතුරු දැනගැනීමේ අයිතියට අදාළ හෙළිදරව් කිරීම්

මහජන වගවීම යටතේ කළ තේමාත්මක විශ්ලේෂණයෙන් හෙළි වූයේ රාජ්‍ය ප්‍රතිපත්ති සාමාන්‍යයෙන් ප්‍රගාමීව හෙළිදරව් කිරීම සිදුවූවත්, රජයේ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් බොහෝ දුරට එසේ හෙළි නොකෙරෙන බවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු අපැහැදිලි වීම නිසාවෙන් ප්‍රතිපත්ති සම්පාදනය කරන ක්‍රියාවලිය විමසුමට ලක් කිරීමට මහජනතාවට ඇති හැකියාව සීමා වේ. රාජ්‍ය අධිකාරීන්ගෙන් 42%ක් ටෙන්ඩර් උපප්‍රවර්ගය ප්‍රකාශනය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත්තේ ය. කෙසේ වෙතත්, සාර්ථක ටෙන්ඩර් පිරිනැමීම් සහ පිරිනැමීම් ප්‍රකාශන උපකාණ්ඩය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත්තේ රාජ්‍ය අධිකාරීන්ගෙන් 6% ක් පමණි. ටෙන්ඩර් දැන්වීම් ප්‍රකාශයට පත් කෙරුණත්, ටෙන්ඩර් ප්‍රදානයන් ප්‍රසිද්ධ නොකෙරෙන බව මෙයින් පෙනී යයි.


මහජන ප්‍රවේශය තේමාව සැළකූ විට, 'මහජන සහභාගීත්වය' කාණ්ඩය සියලුම රාජ්‍ය අධිකාරීන් අඩුම ලකුණු ලබා ගත් කාණ්ඩ අතර විය. රාජ්‍ය ආයතන කිහිපයක් ද රාජ්‍ය සේවා කාණ්ඩය යටතේ තොරතුරු ලබා දී නැත. මෙම තත්ත්වය, ආණ්ඩුවේ තීරණ ගැනීමෙ ක්‍රියාවලියේ මහජන සහභාගීත්වය සීමා කිරීමට හේතු විය හැකිය.

තොරතුරු දැනගැනීමේ අයිතියට අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ තේමාත්මක විශ්ලේෂණවල සොයාගැනීම්වලින් ඇඟවෙන්නේ රාජ්‍ය අධිකාරීන් විසින් තොරතුරු දැනගැනීමේ පනත සහ එහි රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක නොකරන බවයි. තොරතුරු නිලධාරියාගේ සහ/හෝ නම් කරන ලද නිලධාරියාගේ සම්බන්ධතා තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට රාජ්‍ය අධිකාරීන් දහයක් අසමත් විය. තොරතුරු ප්‍රගාමීව

ප්‍රසිද්ධ කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ පණතින් දැනටමත් සකසා දී ඇති අවකාශය, තොරතුරු දැනගැනීමේ අයිතිය වඩා කාර්යක්ෂම ලෙස භාවිතයේ යෙදීමට අවස්ථාව සළසා දෙන්නකි. කෙසේ වෙතත්, රාජ්‍ය අධිකාරීන්ගෙන් බහුතරයක් මෙම කාණ්ඩය යටතේ ලබාගත්තේ ලකුණු 0කි. මීට අමතරව, තොරතුරු දැනගැනීමේ පනතේ 9 වැනි වගන්තිය යටතේ පූර්ව රාජ්‍ය ආයෝජන පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේදී බහුතර රාජ්‍ය අධිකාරීන්ගේ ක්‍රියාකාරීත්වය ද, ප්‍රමාණවත් මට්ටමේ නැත.

**තොරතුරු භාවිතා කිරීමේ පහසුව** අනුව, ප්‍රදර්ශිතය 04 මගින් පෙන්නුම් කරන්නේ රාජ්‍ය අධිකාරීන්ගෙන් බහුතරයක් 'මධ්‍යස්ථ අසතුටුදායක' කාණ්ඩ යටතේ ලකුණු ලබා ඇති බවයි.

**ප්‍රදර්ශිතය 4: 2022 දී තොරතුරු භාවිතා කිරීමේ හැකියාව**




බොහෝ තොරතුරු ප්‍රකාශයට පත්කර තිබුණේ ඉංග්‍රීසි භාෂාවෙනි. සිංහල සහ දෙමළ, පිළිවෙලින් දෙවෙනි සහ තුන්වෙනි තැන්වල පැවතිණ. කෙසේ වෙතත්, සාමාන්‍ය භාෂා ප්‍රවේශ්‍යතා ලකුණ 38% ක් වූ බැවින්, තොරතුරු ත්‍රෛභාෂා ප්‍රවේශතාවයේ සැලකිය යුතු හිඩැස් ඇත.

වාර්තාවේ එක් ප්‍රධාන සොයාගැනීමක් වන්නේ තොරතුරු හෙළිදරව් කිරීමේදී භාෂා නැඹුරුවක් පැවතීමයි. මෙම නැඹුරුතාවය තක්සේරු කිරීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් තොරතුරු අනාවරණය කර තිබීමට අදාළව අදාළ රාජ්‍ය අධිකාරිය ලබාගෙන තිබෙන ලකුණු, සිංහල සහ දෙමළ භාෂාවලින් තොරතුරු අනාවරණය කර තිබීමට අදාළව ලබාගෙත් ලකුණු සමග සංසන්දනය කිරීම සිදුවිය.

භාෂා නැඹුරුතාවයට ලැබුණු ලකුණු වලින් පෙනී යන්නේ වනජීවී අමාත්‍යාංශය සහ ජනාධිපති කාර්යාලය භාෂා භාවිතය අතින් වඩාත් ජනතා හිතකාමී රාජ්‍ය අධිකාරීන් වන බවයි. ආයෝජන මණ්ඩලය භාෂා නැඹුරුතාවය අතින් සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයටම දක්වා ඇති අවධානය ඉතා අවමය. එබැවින් අවම භාෂා හිතකාමී රාජ්‍ය අධිකාරිය වන්නේ ආයෝජන මණ්ඩලයයි. මෙලෙස පවතින භාෂා නැඹුරුතාවයන්, විශේෂයෙන්ම ඉංග්‍රීසි නොවන කථිකයන්ට, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාවට අභියෝගයක් ඉදිරිපත් කරයි.

විවෘතභාවය අතින් ආණ්ඩුව ලබාගෙන ඇත්තේ, එනම්, තොරතුරු හෙළිදරව් කිරීම (75%) සහ තොරතුරු භාවිතා කිරීමට ඇති පහසුව (25%) යන ඒවායේ බර තැබූ ලකුණක් වන, 2022 වසර සඳහා මුළු ලකුණු 100කින්, 33ක් පමණකි.

මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ ලකුණු අඩුවෙන් ලබාගෙන ඇති අමාත්‍යාංශ විශාල සංඛ්‍යාවක් තිබීමයි. විවෘතභාවය වැඩිදියුණු කිරීමට නම් අමාත්‍යාංශ හරහා අන්තර්ගතයන් අනාවරණය කිරීම මෙන්ම මෙන්ම එසේ

අනාවරණය කෙරෙන අන්තර්ගතයන් භාවිතා කිරීමට ඇති හැකියාව යන දෙකම වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ප්‍රමුඛත්වය දිය යුතු බව වාර්තාවෙන් යෝජනා  කෙරේ.

ප්‍රගාමීව තොරතුරු හෙළිදරව් කිරීම, විශේෂයෙන්ම සිංහල සහ දෙමළ භාෂාවලින් එම තොරතුරු හෙළිදරව් කිරීම, වැඩි දියුණු කරගැනීමට රාජ්‍ය අධිකාරීන් කටයුතු කළ යුතුව තිබෙණ බව මෙම වාර්තාවෙන් අවධාරණය කරයි. වාර්තාව අවසන් කෙරෙන්නේ, එසේ කිරීම ඔස්සේ රාජ්‍ය අධිකාරීන් හි විනිවිදභාවයේ සහ වගවීමේ සංස්කෘත්යක් පෝෂණය කිරීම වෙනුවෙන්, තොරතුරු දැනගැනීමේ පණත ක්‍රියාශීලීව භාවිතයේ යෙදවීම සහතික කළ යුතුව තිබෙණ බව පෙන්වා දෙමින්ය.

Verité Research
Strategic Analysis for Asia

A | No. 5A, Police Park Place, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W| www.veriteresearch.org